## සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය

*සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය භාරයේ, විදේශ කටයුතු අමාත්‍යංශය,*
*ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බැරන් ජයතිලක මාවත, කොළඹ 01*

## நல்லிணக்கப் பொறிமுறைகள் பற்றிய கலந்தாலோசனைக்கான செயலணி

*மே/பா நல்லிணக்க பொறிமுறைகளை ஒருங்கிணைப்பதற்கான செயலகம், வெளிவிவகார அமைச்சு,*
*குடியரசுக் கட்டிடம், சேர்.பாரோன் ஜயதிலக மாவத்தை, கொழும்பு 01*

## Consultation Task Force on Reconciliation Mechanisms

*C/O Secretariat for Coordinating Reconciliation Mechanisms, The Ministry of Foreign Affairs,*
*Republic Building, Sir Baron Jayathilaka Mw., Colombo 01*

Phone : +94 11 4232857
Fax : +94 112325353

www.scrm.gov.lk
ctf.srilanka@gmail.com

**මාධ්‍ය නිවේදනය**

# <u>අදහස් ලබාගැනීමේ අවසාන දිනය 2016 අගෝස්තු 10 දක්වා දීර්ඝ කෙරේ</u>

ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව ඇති කිරීම උදෙසා, **සත්‍යය සෙවීම, මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ වගවීම සහතික කිරීම සහ හානිපූරණය සඳහා** පියවර ගැනීමට අදාළ ක්‍රියාවලි සහ යාන්ත්‍රණ සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම, 2016 ජනවාරි 26 වැනිදා අගමැතිවරයා විසින් පත් කරන ලද **'සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායට' පැවරී ඇත.**

එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් යාන්ත්‍රණ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමුව තිබේ:

1. විශේෂ නීති උපදේශකයෙකු සහිත අධිකරණ යාන්ත්‍රණයක්
2. සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව සහ, අතීත වැරදි නැවත ඇතිවීම වළකාලීම සඳහා වන කොමිසමක්
3. සහන සම්පාදන කාර්යාලයක්
4. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක්

**සත්‍යය සොයා ගැනීමටත්, යුක්තිය පසිඳලීමටත්, වගවීම සහතික කිරීම සහ හානිපූරණය සඳහා පිළියම් යෙදීමටත් යොදා ගත හැකි ව්‍යුහ, ක්‍රියාපරිපාටි සහ පියවර සකස් විය යුතු ආකාරය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලෙස 'කාර්ය සාධක බලකාය' ජනතාවගෙන් ඉල්ලා සිටී.**

එහිදී,

(අ) ඉහත සඳහන් යාන්ත්‍රණ එකක් හෝ ඊට වැඩි ගණනක්, (එක් එක් යාන්ත්‍රණය, සංයුතිය, උල්ලංඝන වර්ග සහ ඉටු කළ යුතු කර්තව්‍යයන් පිළිබඳ බල සීමාව තුළ සේම ඉන් පිටතත්)

(ආ) විකල්ප ව්‍යුහ සහ ක්‍රියාපරිපාටිද, විශේෂිත උල්ලංඝනයක් හෝ බහු-විධ උල්ලංඝනයන්ද, වෙනත් අදාළ ප්‍රශ්නද, (එක් එක් යාන්ත්‍රණය, එහි සංයුතිය, උල්ලංඝන වර්ග සහ ඉටු කළ යුතු කර්තව්‍යයන් පිළිබඳ බල සීමාව තුළ සේම ඉන් පිටතත්)

පිළිබඳව ඔබේ අදහස් දැක්විය හැකිය.

අදහස් දැක්වීම්, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන ඕනෑම භාෂාවකින්, පුද්ගලයකු ලෙස, කණ්ඩායමක් හෝ සංවිධානයක් ලෙස ද ඉදිරිපත් කළ හැකිය. අවසානයේදී ආණ්ඩුව වෙත ඉදිරිපත් කරනු ලබන සහ ප්‍රසිද්ධියට පත් කරනු ලබන වාර්තාව සකස් කිරීම සඳහා මේ අදහස් උපයෝගී කර ගනු ලැබේ.

**අදහස් දැක්වීම් භාර ගන්නා කාලය 2016 අගෝස්තු 10 වැනි දා දක්වා දීර්ඝ කර ඇත. එසේ වුවද, කල් තියා ඔබේ අදහස් ඉදිරිපත් කරන්නේ නම් මැනවි.**

**ඔබගේ අදහස්, ctf.srilanka@gmail.com නැමැති විද්‍යුත් තැපැල ඔස්සේ හෝ, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, ලේකම්, සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය, සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය, ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්ද ලියා දැන්විය හැකිය.

වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් ලබා ගනුවස්, ඔබව සම්බන්ධ කර ගත හැකි තොරතුරක් ඒ සමග සපයන ලෙස 'කාර්ය සාධක බලකාය' කරුණාවෙන් ඉල්ලා සිටී.

**කාර්ය සාධක බලකායට ඔබ ඉදිරිපත් කරන අදහස් රහසිගතව තබා ගත යුතු යැයි ඔබ ඉල්ලා සිටියොත් මිස, ඒ අදහස් දැක්වීම් ප්‍රසිද්ධ කෙරෙන බව කරුණාවෙන් සලකන්න.**

###